සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**07 ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය - 2024** | **21 S I,II**

නම: ..........................................

**සිංහල භාෂාව හා සාහිත්‍යය** | **කාලය පැය දෙකයි**

## I කොටස

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලටම මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න
- අංක 1 සිට 2 තෙක් ප්‍රශ්නවලට උචිත පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සිය දියණියකගේ නොමනා ක්‍රියා කලාපය දුටු වයසක මව හිස හැරුණු අතේ ගියා ය.
 1. හිස් අතින් යෑම  3. සඟවා ගැනීම
 2. අරමුණකින් තොරව යෑම  4. පාර සොයාගත නොහැකි වීම.

02. අප ගමන්ගත් බස්රථයේ රියදුරු අධික වේගයෙන් රිය පැදවූයේ ය.
 1. හැටට හැටේ  2. තිකිණි සොයනවා  3. බළලා මල්ලෙන් එළියට පැන්නා  4. තරු පෙනුණා

03. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.
 1. වාර්ථාව, නිශ්ඵල, පරිගණකය, විශේශ  2. වර්ථමාන, සමස්ත, සාකච්ඡා, කණ්නාඩි

04. මධ්‍යම පුරුෂ අතීත කාල බහුවචන ක්‍රියා පදයක් වන්නේ,
 1. ගියහ  2. ගියෙහු  3. ගියෝ ය.  4. ගියෙමු

05. බහුවචන අනුක්ත නාම පදයක් වන්නේ,
 1. ඔවුහු  2. ශිෂ්‍යයෙකු  3. මිනිසුන්  4. ළමයි

06. උපසර්ගයක් රහිත වචනය වන්නේ,
 1. විකසිත  2. සුවිශේෂ  3. අභියාචනා  4. අනුගමනය

07. ''මා දුටු මුල් හිරු පෙන්නු ලංකා'' ගීතයේ රචකයා
 1. මඩවල එස්. රත්නායක මහතා  3. කරුණාරත්න අමරසිංහ මහතා
 2. මහගම සේකර මහතා  4. ඩෝල්ටන් අල්විස් මහතා

08. පහත වාක්‍යාංශවලට උචිත තනි පදය වන්නේ,
 1. රජුගේ ඇත් හළ භාර ප්‍රධානියා -
 2. කිසිවෙකුට බැඳීමක් නැති -

ඉරි ඇඳි පදය අයත් ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.

09. මල්ලී ගසට නැග අඹ කැඩුවේ ය.
 1. අවසන ක්‍රියා  2. පූර්ව ක්‍රියා  3. මිශ්‍ර ක්‍රියා  4. විධි ක්‍රියා

10. ඔවුහු ගී ගයමින් අලංකාර නර්තනයක යෙදෙති.
 1. පූර්ව ක්‍රියා  2. අවසාන ක්‍රියා  3. විධි ක්‍රියා  4. මිශ්‍ර ක්‍රියා

11. කමත් භාෂාවේ '' පැගිරි බෝය පිරීම'' යනුවෙන් හඳුන්වන්නේ,
 1. බුලත් විට කෑම  2. කොළ රොඩු රැස් කිරීම.  3. කෑම ගැනීම.  4. මඩුවන් හලා බෑම

12. අභිකුණ්ඨික ජනයා පිළිබඳ සඳහන් පැරණි ගද්‍ය කෘතියක් නොවන්නේ,
 1. සද්ධර්මාලංකාරයේ අභිකුණ්ඨිකවත්ථු  3. සත්තුභත්ත ජාතකය
 2. චම්පෙය්‍ය ජාතකය  4. භූරිදත්ත ජාතකය

13. පහත වචනවලට උචිත සමානාර්ථ පදය බැගින් ලියන්න.
   1. වනය -
   2. පුදුමය -

14. පහත වචනවලට උචිත විරුද්ධ පදය ලියන්න.
   1. කාරුණික -
   2. කීර්තිය -

15. සඤ්ඤක අක්ෂරයක් නොයෙදුණු වචනය වන්නේ,
   1. හොඬ 2. ගනඳුර 3. දඹල 4. ස්වරූපය

16. මහාප්‍රාණ අක්ෂරයක් සහිත වචනය වන්නේ,
   1. නිශ්චල 2. ශිෂ්ටාචාරය 3. කොට්ඨාසය 4. ආණ්ඩුව

17. පහත වාක්‍යයේ සඳහන් නාම විශේෂණ පදයක් හා ක්‍රියා විශේෂණ පදයක් ලියා දක්වන්න.
   නපුරු සිංහ නාදයට බිය වූ අහිංසක මුවෝ ගස් අතරින් වේගයෙන් දිවූහ.
   1. නාම විශේෂණ -
   2. ක්‍රියා විශේෂණ -

18. හිස්තැනට ගැළපෙන පදය තෝරා හිස්තැනෙහි ලියන්න.
   1. ඔවුහු සිය ...................................... (දරුවන් / දරුවෝ/ දරුවෙක්) අතහැර විදේශ රටක පදිංචියට ගියහ.
   2. ...................................... (ශිෂ්‍යාවෝ/ ශිෂ්‍යාවක්/ ශිෂ්‍යාවන්) පාසල් බස් රථයෙන් බැස පාසලට දිව ගියහ.

19. පහත සාම්ප්‍රදායික යෙදුම් 2 කි. හිස්තැන් පුරවන්න.
   1. කියන්නා කෙසේ කීවත් ........................................................
   2. මඬේ සිට වූ ........................................................

20. නිවැරදිව පද බෙදා නැවත ලියන්න.
   අප අනු ගමනයක ළයුත්තේ හො ඳදේ වල්ම ය.

(මුළු ලකුණු 2x20=40)

## II කොටස

පළමු, දෙවන හා තෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු නොලියා අමතර කඩදාසි භාවිත කරන්න.

01. මෙම ප්‍රශ්නයේ සියලු ම කොටස්වලට පිළිතුරු සපයන්න.

1. පහත වචන යොදා ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය නිර්මාණය කරන්න.
   I. අද  II. අඳ
2. සිංහල අක්ෂර මාලාවේ,
   I. ස්වර අක්ෂර ගණන කීයද?  II. ඉන් 5ක් ලියා දක්වන්න.
3. පහත කෘති රචනා කළ ලේඛකයන් නම් කරන්න.
   I. කෝමල රේඛා  II. විනි විඳිමි අඳුර
4. පහත වචනවල අරුත් ලියන්න.
   I. පාටව කරවා  II. නේත්‍ර යුග්මය
5. පහත කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.
   සිලිලාරෙක හෙල් මැලි
   පෙති අතරින් සැලි සැලි
   ..........................................
   ..........................................

(ලකුණු 2x5=10)

02. පහත මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 ක පමණ රචනයක් ලියන්න.

1. මතින් තොර රටක් ගොඩනගමු.
2. කියවීමෙහි අගය
3. සැඳෑවක චමත්කාරය
4. ශ්‍රී පාදස්ථානයේ වැදගත්කම
5. උදෑසන පාසලට පැමිණි විට ඔබට මුණගැසුණු යහළුවකු / යෙහෙළියක හා ඇති වූ සංවාදයක් ලියන්න.
   (වචන 150 ක පමණ)  (ලකුණු 20)

03. (අ) සහ (ආ) යන කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

(අ) ඔබේ පාසලේ ක්‍රීඩා පිටිය ක්‍රීඩා පුහුණුවීම් හා තරඟ පැවැත්වීමට නොහැකි ආකාරයට අබලන් වී ඇත. සිසු සිසුවියන් 2000ක් පමණ ඉගෙනුම ලබන එහි මේ වන විට විවිධ ක්‍රීඩා හැකියා මත සමස්ත ලංකා ජයග්‍රහණ බොහොමයක් වාර්තා කර ඇති අතර ඔවුන්ගේ ඉදිරි ක්‍රීඩා කටයුතු සාර්ථක කර ගැනීමට ක්‍රීඩා පිටිය සකසා දීමට කටයුතු කරන ලෙස ඉල්ලමින් (ඔබ පාසල් ක්‍රීඩා සංගමයේ ලේකම් ධනුක ජයවර්ධන යැයි සිතා) ක්‍රීඩා අමාත්‍ය තුමාට ලියනු ලබන රාජකාරි ලිපිය ලියන්න.

නැතහොත්

(ආ) ඔබේ පාසලේ පැවැත්වීමට නියමිත වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගි වන ලෙස පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ඩබ්. එම්. ටී. මධුජිත් මහතාට දන්වා යවන ආරාධනා පත්‍රය සකස් කරන්න. (දිනය - 2024 නොවැම්බර් 22)  (ලකුණු 10)

04. පහත සඳහන් ඡේදයේ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ජීවිතය සහ ආචාරධර්ම හා සම්බන්ධ විචිත්‍ර අදහස් පද්‍යයෙන් ප්‍රකාශ කළ අවස්ථා පැරණි සාහිත්‍යයෙහි හමුවෙයි. ඒවා බොහෝ විට ආගමික නීතිය හෝ රාජ්‍ය නීතිය හෝ සම්බන්ධ උපදෙස් දීමේ අරමුණින් ලියා තිබේ. එක් සාහිත්‍යයක ප්‍රචලිතව ඇති උපදේශාත්මක නිර්මාණ වලින් වෙන සාහිත්‍යයන් පෝෂණය කිරීමේ සම්ප්‍රදායක් පැවති බව ද පෙනේ. ඒ අනුව පැරණි සංස්කෘත සාහිත්‍යයෙන් පාලි සාහිත්‍යයට ද, ඒ දෙකෙන් ම දෙමළ සාහිත්‍යයට ද ඒ සියල්ලෙන්ම සිංහල සාහිත්‍යයට ද පැමිණි උපදේශාත්මක අදහස් හමුවෙයි. සිංහල උපදේශ සාහිත්‍ය සංස්කෘත, පාලි හා දෙමළ කාව්‍යයන්ගෙන් පෝෂණය වී තිබේ. සිංහලයෙහි හමුවන උපදේශ කාව්‍ය වන්නේ, ලෝවැඩ සඟරාව, සුභාෂිතය හා ලෝකෝපකාරය යන කෘති තුනයි.

වීදාගම මෛත්‍රෙය හිමියන් විසින් ලෝවැඩ සඟරාවත්, රණස්ගල්ලේ හිමියන් විසින් ලෝකෝපකාරයත්, අගලියවන්න මුකවෙට්ටිතුමා විසින් සුභාෂිතයත්, රචනා කොට ඇති අතර කුමන ජාතියකට කුමන ආගමකට අයත් වුවද යහපත් ජීවිතයකට අදාළ ගුණධර්ම සැමට එක සමාන වන මෙම උපදේශ ග්‍රන්ථ සාක්ෂි දරයි. යහපත් ජීවිතයක් ගත කිරීම උදෙසා මින් මහඟු පිටුවහලක් ලබා ගත හැකි ය.

1. මෙහි සඳහන් ආකාරයට පැරණි සාහිත්‍යයෙන් හමුවන්නේ මොනවා ද?
2. සිංහල උපදේශ සාහිත්‍යය පෝෂණය වී ඇත්තේ කුමන උපදේශ කාව්‍යයන්ගෙන් ද?

3. පැරණි උපදේශ සාහිත්‍යය ග්‍රන්ථ ලියා ඇත්තේ කුමන අරමුණකින් ද?
4. සිංහලයෙහි හමුවන උපදේශ කාව්‍ය 2 ක් නම් කරන්න.
5. මෙම ඡේදයේ සඳහන් සඤ්ඤක අක්ෂරයක් සහිත වචනයක් හා මහාප්‍රාණ අක්ෂරයක් සහිත වචනයක් ලියන්න.

(ලකුණු 2x5=10)

05. 1. පහත වාක්‍ය බහුවචනයට හරවා ලියන්න.

I. ලේනා උඹයක් කෑවේ ය.
II. මම ගීතයක් ගායනා කරමි.
III. කුරුල්ලා ගස් බෙනයක කැදැල්ල සාදයි.
IV. නුඹ ගම්මානය පුරා දිව යන්නෙහි.
V. ගෙවිලිය ඇඹුල රැගෙන හේනට ගියා ය. (ලකුණු 1x5=05)

2. පහත වාක්‍ය ස්ත්‍රී ලිංගයට හරවා ලියන්න.

I. මොනරා ගොදුරු සොයා වනය පුරා ඇවිදියි.
II. තාත්තා මා සමඟ පාසලට යයි.
III. උපාසකයෝ පන්සලේ මළුව අලංකාරව අමදිති.
IV. ඇත්තු වනය දෙවනක් කරමින් පැටියා සෙවූහ.
V. හංසයා විලෙහි ඒ මේ අත පීනා යයි. (ලකුණු 1x5=05)

06. පහත සඳහන් ප්‍රකාශ ඇතුළත් පාඩමේ නම හා කා විසින් කා හට කියන ලදදැයි ලියන්න.

I. ''මට ඒක කියලා දෙන්න බැරි වුණා. මේ ගොන් කණුව ළඟම ඉන්නේ මුදුනා''
II. ''එහේ ගියොත් සුදු අප්පොත් එක්ක සෙල්ලම් කරතැකි.''
III. ''පින් අත් වේවා. ගැත්තා ඉතා සුවෙන් සිටින බව දන්වා සිටිමි.''
IV. ''අනේ කමක් නැහැ හාමිනේ. පුංචි අයගේ ආසාවනෙ.''
V. ''ඊට තොප වික්ෂේප නොව.....'' (ලකුණු 2x5=10)

07. පහත කවි සම්පූර්ණ කරන්න.

I. මේ කාගේ මේ කමතා
ඉරු දෙවියන්ගේ කමතා
.................................
.................................

II. නෙලුම් කොළේ නොම ඇලී
දිය බිඳුවක හැලි හැලී
................ ..................
.................................

III. මා ගත ලේ බිඳු එක්කොට ලංකා
තළලත තිලකය අන්දමි ලංකා
.................................
.................................

IV. ඉසුරෙන් පිරිහුණත්
සුදන තම ගුණය අත් නොහරිත්
.................................
.................................

V. සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණකොළ පිට්ටනියක්
.................................
................................. (ලකුණු 2x5=10)